මාධ්‍ය නිවේදන අංක 17

**මැතිවරණ කොමිෂන් සභාව**

# මාධ්‍ය නිවේදනය

නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ දී තරග කරනු ලබන අපේක්ෂකයන් හෝ දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් විසින් ජනතා මනාපය ලබාගැනීම වෙනුවෙන් අසීමාන්තිකව කරනු ලබන වියදම් පාලනය කිරීම පිණිස, මැතිවරණ කොමිෂන් සභාවේ අදහස් හා යෝජනා අනුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් සකස් කොට තිබෙන, නීතිපතිවරයා ද එකඟතාව ප්‍රකාශ කරනු ලැබ ඇති හා මැතිවරණ නීති ප්‍රතිසංස්කරණය සඳහා පත්කොට ඇති පාර්ලිමේන්තු විශේෂ තේරීම් කාරක සභාව විසින් ද නිර්දේශ කර ඇති "මැතිවරණ ප්‍රචාරණ වියදම් සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත" අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා ජනාධිපතිතුමා වෙත යොමු කරන ලද බව නිවේදනය කරන අතර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද විගස පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමට මැතිවරණ කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

මැතිවරණ නීති සංශෝධනය පිණිස පත්කරන ලද විශේෂ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා කඩිනමින් සම්මත කිරීම මගින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට අවැසි වාතාවරණය සකස් කිරීමේ වැදගත්කම අවධාරණය කරමින් මහනුවර උපොෂිත පුෂ්පාරාම විහාරද්වයාධිපති තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහා විහාරවංශික ශ්‍යාමොපාලි මහානිකායේ මහානායක ස්ථවිරයන් වහන්සේ විසින් ගරු ජනාධිපතිතුමා වෙත ලිපියක් යොමු කොට ඇත. අතිගරු මහානායක ස්වාමීන්වහන්සේගේ යථෝක්ත ලිපිය අනුව මතු දැක්වෙන සාධනීය යෝජනා ඉදිරියේ දී පැවැත්වීමට නියමිත කුමන හෝ ඡන්ද විමසීමකට පෙර සම්මත කොට ජනතා පරමාධිපත්‍යය තහවුරු කිරීම දේශයේ අවශ්‍යතාව බව ද පෙන්වා දී තිබේ.

01. මැතිවරණ වියදම් පාලනයට නීති හඳුන්වා දීම.
02. කාන්තා හා තරුණ නියෝජනය ශක්තිමත් කිරීම.
03. තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමට සුදුසුකම් නොලබන එහෙත් මැතිවරණ දිනයේ රාජකාරි සිදුකරන පිරිසට පූර්ව ඡන්ද ප්‍රකාශ කිරීමට පහසුකම් සැලසීම.
04. මහජන නියෝජිතයන් සඳහා ආචාර ධර්ම පද්ධතියක් නීතිගත කිරීම.
05. මහජන ඡන්දයෙන් තේරී පත් වූ මුත් ජනතා පරමාධිපත්‍යය අවභාවිතා කරන්නේ නම් එවැනි මහජන නියෝජිතයන් ධූර කාලය තුළ ආපසු කැඳවීම සඳහා නීති සම්පාදනය කිරීම.
06. දේශපාලන අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්ති ප්‍රකාශ සඳහා නීතිමය වගවීමක් ඇති කරලීම.
07. මැතිවරණ පැමිණිලි කඩිනමින් විසඳීම සඳහා මැතිවරණ විනිශ්චය සභාවක් ඇති කරලීම.

අතිගරු මහනායක ස්වාමීන්වහන්සේ විසින් ගරු ජනාධිපතිතුමා වෙත යොමු කරන ලද එම ලිපියේ පිටපතක් පහසු පරිශීලනය පිණිස මෙයට යාකොට ඇති බව ද නිවේදනය කරනු ලැබේ.

නිමල් පුංචිහේවා

නීතිඥ නිමල් ජී. පුංචිහේවා
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2022.09.26

මල්වතු මහා විහාරය
මහනුවර

දුරකථන :- 081 2224066
නිල ආරාමය :- 081 2222500

මහනුවර උපෝසථ පූෂ්පාරාම විහාරාධිපති
තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමඞ්ගලාභිධාන
මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ මහානායක ස්ථවිරයන් වහන්සේ

අංකය :- 12460-26 (රාජ්‍ය)

ශ්‍රී බුද්ධ වර්ෂ :- 2566

රාජ්‍ය වර්ෂ :- 2022-09-19

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති
රනිල් වික්‍රමසිංහ මැතිතුමා,
ජනාධිපති කාර්යාලය,
කොළඹ.

ගරු ජනාධිපතිතුමනි,

**<u>ප්‍රශස්ත මැතිවරණ ක්‍රියාවලියක් සඳහා මැතිවරණ පනතේ සිදු කළ යුතු කඩිනම් සංශෝධන පිළිබඳව යි</u>**

දැරිය නොහැකි අධික වියදම හා වංචා දූෂණ මෙන් ම පාරදෘශ්‍යභාවයක් නොමැති වීම හේතුවෙන් පවත්නා මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ දශක ගණනාවක සිට මහජනතාව සිය අප්‍රසාදය පළ කරමින් සිටී. එමෙන් ම ජනතා අපේක්ෂාවන් සාධනය කළ හැකි මහජන නියෝජිතයන් ව්‍යවස්ථාදායක ආයතනයන්ට පත් කිරීමෙහිලා වත්මන් මැතිවරණ ක්‍රමය අසමත් වන බව මහජන අදහසයි. එහෙයින් රටේ ප්‍රතිරූපය ඔසවා තැබිය හැකි ඉහළ ප්‍රජාතන්ත්‍රවාදයක් උදෙසා මං පෙත් විවර කරන ජනතාවාදී මැතිවරණ ක්‍රමයක අවශ්‍යතාව මේ වන විට සමස්ත මහජනතාව විසින් ම පිළිගෙන ඇත.

විශේෂ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ නිර්දේශ මත වත්මන් මැතිවරණ ක්‍රමය තුළ පවත්නා සංදිග්ධතාවන් නිරාකරණය කිරීම උදෙසා මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ නීති සංශෝධනය පිණිස නව කෙටුම්පතක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කොට ඇති බව අප වෙත දන්වා ඇත. එකී කෙටුම්පත තුළ මිශ්‍ර සමානුපාතික ඡන්ද ක්‍රමය ඇතුළු ජනතා පරමාධිපත්‍ය තහවුරු කරන සාධාරණ මැතිවරණයකට අවශ්‍යය බොහෝ නෛතික ප්‍රතිපාදනයන් පිළිබඳ සාධනීය යෝජනා අඩංගු වේ. ඊට අතිරේක වශයෙන් 2022.08.22 දාතමින් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමන් විසින් අප වෙත ඉදිරිපත් කරන්නට යෙදුණු පහත යෝජනාවන් ද මැතිවරණ පනතට ඇතුල් කළ යුතු බව අවධාරණය කරනු කැමැත්තෙමු.

1. මැතිවරණ වියදම් පාලනයට නීති හඳුන්වා දීම
2. කාන්තා හා තරුණ නියෝජනය ශක්තිමත් කිරීම
3. තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමට සුදුසුකම් නොලබන එහෙත් මැතිවරණ දිනයේ රාජකාරී සිදුකරන පිරිසට පූර්ව ඡන්ද ප්‍රකාශ කිරීම පහසුකම් සැලසීම
4. මහජන නියෝජිතයන් සඳහා ආචාර ධර්ම පද්ධතියක් නීතිගත කිරීම

CS CamScanner

මල්වතු මහා විහාරය
මහනුවර

දුරකථන :- 081 2224066
නිල පාරාමිය :- 081 2222500

මහනුවර උපෝසථ පුෂ්පාරාම විහාරාධිපති
තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමඞ්ගලාභිධාන
මහා විහාරවංශික ශ්‍යාමෝපාලි මහානිකායේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

අංකය :- ____________  ශ්‍රී බුද්ධ වර්ෂ :- ____________

රාජ්‍ය වර්ෂ :- ____________

5. මහජන ඡන්දයෙන් තෝරී පත් වූ මුත් ජනතා පරමාධිපත්‍යය අවභාවිත කරන්නේ නම් එවැනි මහජන නියෝජිතයන් ධුර කාලය තුළ ආපසු කැඳවීම් සඳහා නීති සම්පාදනය කිරීම

6. දේශපාලන අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්ති ප්‍රකාශ සඳහා නීතිමය වගවීමක් ඇති කරලීම

7. මැතිවරණ පැමිණිලි කඩිනමින් විසඳීම සඳහා මැතිවරණ විනිශ්චය සභාවක් ඇතිකරලීම

ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම යනු නිදහස් හා සාධාරණ මැතිවරණයක් තුළින් ජනතා පරමාධිපත්‍ය තහවුරු කිරීමයි. එහෙයින් මැතිවරණ නීති සංශෝධනය කොට ජනතා පරමාධිපත්‍යය සුරක්ෂිත කරමින් ඉහළ ප්‍රජාතන්ත්‍රවාදයට මං පෙත් විවර කරන මෙම සාධනීය යෝජනා මාලාව කෙරෙහි ගරු ජනාධිපතිතුමන්ගේ කඩිනම් අවධානය යොමු කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

නැවත මැතිවරණයක් පැවැත්වීමට පෙර මෙකී යෝජනා මාලාව ප්‍රකාරව මැතිවරණ පනත වහා සංශෝධනය කොට මහජන විශ්වාසය හා ප්‍රසාදය සුරැකෙන පරිදි මැතිවරණයක් පැවැත්වීම අද දේශයේ අවශ්‍යතාව බව වැඩිදුරටත් මෙයින් දන්වා සිටිනු කැමැත්තෙමු.

ඔබතුමන්ට රත්නත්‍රයේ ආශිර්වාදය ලැබේවායි ආශංසනය කරමින.

ඒ වගත් මෙසේ ම,

තිබ්බටුවාවේ සුමඞ්ගල



CS CamScanner